# 12 පාඩම
द्वादशः पाठः

# නාම වරනැගීම - III
## (ඉකාරාන්ත පුරුෂලිංග मुनि ශබ්දය)

### 12.1 ක්‍රියාකාරකම

ඉකාරාන්ත පුරුෂලිංග मुनि ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | मुनिः | मुनी | मुनयः |
| सम्बोधन | हे मुने | हे मुनी | हे मुनयः |
| द्वितीया | मुनिम् | मुनी | मुनीन् |
| तृतीया | मुनिना | मुनिभ्याम् | मुनिभिः |
| चतुर्थी | मुनये | मुनिभ्याम् | मुनिभ्यः |
| पञ्चमी | मुनेः | मुनिभ्याम् | मुनिभ्यः |
| षष्ठी | मुनेः | मुन्योः | मुनीनाम् |
| सप्तमी | मुनौ | मुन्योः | मुनिषु |

### 12.2 ක්‍රියාකාරකම

(मुनि) ශබ්දයට සමාන ශබ්ද වාචෝද්ගත කර වරනගමු.

| | | | |
|---|---|---|---|
| १ कपि | - වඳුරා | ७ सारथि | - රියදුරා |
| २ अधिपति | - අධිපතියා | ८ अहि | - සර්පයා |
| ३ अरि | - සතුරා | ९ अलि | - බඹරා |
| ४ यति | - භික්ෂුව | १० रवि | - හිරු |
| ५ मणि | - මැණික | ११ असि | - කඩුව |
| ६ गिरि | - කන්ද | १२ भूपति | - රජතුමා |

१३ जलधि - මුහුද
१४ अग्नि - ගින්න
१५ इभारि - සිංහයා
१६ तिमि - මාළුවා
१७ गृहपति - ගෙහිමියා
१८ छेदि - වඩුවා
१९ निशापति - සඳ
२० घोटारि - මීමා

## 12.1 අභ්‍යාසය

(मुनि) ශබ්දයට සමාන ශබ්දවල විභක්තියට අදාළ වචන යොදා හිස් තැන් පුරවන්න.

| शब्दाः | विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| कपि | प्रथमा | कपिः | | कपयः |
| गिरि | प्रथमा | | गिरी | |
| अरि | सम्बोधन | हे अरे | | |
| असि | सम्बोधन | | हे असी | |
| मणि | द्वितीया | मणिम् | | |
| रवि | द्वितीया | | रवी | |
| यति | तृतीया | यतिना | | |
| अलि | तृतीया | | | अलिभिः |
| अधिपति | चतुर्थी | अधिपतये | | |
| सेनापति | चतुर्थी | | सेनापतिभ्याम् | |
| मुनि | पञ्चमी | मुनेः | | |
| गिरि | पञ्चमी | | | गिरिभ्यः |
| अहि | षष्ठी | | | अहीनाम् |
| अग्नि | षष्ठी | | अग्नयोः | |
| भूपति | सप्तमी | भूपतौ | | |
| घोटारि | सप्तमी | | | घोटारिषु |



12.1 රූපය

## 12.2 අභ්‍යාසය

1. 12.1 රූපය පරීක්ෂා කොට බලා ඒ අනුව ඉකාරාන්ත නාමපදවල ඒකවචන ලියන්න.
2. එම ඒකවචන නාම පද ද්විවචන, බහුවචනවලට හරවන්න.
3. 12.1 අභ්‍යාසයෙන් ප්‍රකාශ වන ක්‍රියාපදවල ඒකවචන ලියන්න.
4. එම ඒකවචන ක්‍රියාපද ද්විවචන, බහුවචනවලට හරවන්න.
5. 12.1 අභ්‍යාසයේ ඇති ඉකාරාන්ත ඒකවචන නාමපද ඒකවචන ක්‍රියා පද සමග ගළපා වචන දෙකේ වාක්‍ය **දහයක්** ලියන්න.
6. එම ඒකවචන වාක්‍ය ද්විවචන, බහුවචනවලට හරවා ලියන්න.

### සම්බෝධන විභක්තිය හඳුනාගනිමු.

- **ආමන්ත්‍රණය** සම්බෝධන විභක්තියෙන් යෙදේ. **ආමන්ත්‍රණය** නම් කෙනකු ඇමතීම යි. මෙය හඳුනාගැනීමට **हे** යන නිපාතය මුලට යෙදේ.

  **हे बालक** - පින්වත් ළමය,

  **हे बालकौ** - පින්වත් ළමයි දෙදෙනෙනි,

  **हे बालकाः** - පින්වත් ළමයිනි,

- ඇමතීමත් සමග ම අණ කිරීම (විධානය) සිදු කරයි. එය විධාන ක්‍රියාව වශයෙන් හැඳින්වේ. විධාන ක්‍රියාව සාදාගන්නා පහසු ක්‍රමයක් නම්

  1. වර්තමාන කාල, ප්‍රථම පුරුෂ, ඒකවචන ක්‍රියාවේ "ति" ඉවත් කරන්න.
  2. ක්‍රියාවේ ඉතිරි කොටස විධාන ක්‍රියා මධ්‍යමපුරුෂ ඒකවචනය යි.

  **पठति** > **पठ** = **पठ** පාඩම් කරන්න = පාඩම් කරව.

3. එම ඒකවචන විධාන ක්‍රියාවට "**तम्**" එකතු කළ විට මධ්‍යම පුරුෂ ද්විවචනය සෑදේ.

**पठ** + **तम्** - **पठतम्** දෙදෙන පාඩම් කරවු.

4. එම ඒකවචන විධාන ක්‍රියාවට "**त**" එකතු කළ විට මධ්‍යම පුරුෂ බහුවචනය සෑදේ.

**पठ** + **त** - **पठत** - පාඩම් කරවු.

## 12.3 අභ්‍යාසය

**පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලට නගන්න.**

१ हे कुमार, पठ ।

२ हे बालकौ, धावतम् ।

३ हे पुरुषाः, गच्छत ।

४ हे वानर, त्वं खाद ।

५ हे शुनकौ, युवां वहतम् ।

६ हे शुकाः, कूजत ।

७ हे बालकाः, यूयं नमत ।

८ हे गजौ, युवां खादतम् ।

९ हे सूदाः, यूयं पचत ।

१० हे बिडाल, त्वं पिब ।